ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 615

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

3වන මට්ටම 2022/2023

අවසාන පරීක්ෂණය

EPU3234 - විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - සෞන්දර්ය හා නිර්මාණාත්මක කලාව

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.02.03 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

**01 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01-කොටස

01. "සෞන්දර්ය අධ්‍යාපනය" යන යෙදුමෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

02. ළමා චිත්‍ර සහ ඔවුන්ගේ නිර්මාණ තක්සේරු කිරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක 03 ක් ලියන්න.

03. මහත්මා ගාන්ධි දර්ශනයේ ඇතුලත් 3H සංකල්පය හිස, අත සහ හදවත, අධ්‍යාපනයෙන් සංවර්ධනය කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් කෙටියෙන් සාකච්ඡා කරන්න.

04. හොවර්ඩ් ගාඩිනර් (Howard Gardener) විසින් යෝජනා කරන ලද "බහුවිධ බුද්ධි න්‍යායනි" (Theory of Multiple Intelligences) අඩංගු බුද්ධි අට (08) කෙටියෙන් විස්තර කරන්න.

05. පෙර පාසල් දරුවන්ට පෙර පාසල් කාලය තුළ ගවේෂණය කිරීමට සහ විනෝද වීමට සුදුසු සංගීත භාණ්ඩ පහක් (05) පැහැදිලි කරන්න.

06. ප්‍රාථමික පාසල් ළමුන් සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී ගුරුවරයා විසින් සලකා බැලිය යුතු කරුණු තුනක් (03) සඳහන් කරන්න.

07. කතන්දර ක්‍රමය සමන්විත වන ප්‍රධාන කොටස් දෙක (02) සංසන්දනය කරන්න.

08. ප්‍රාථමික පාසල් සෞන්දර්ය අධ්‍යාපනය විෂය නිර්මාණය කිරීමේදී ඇතුලත්කර ඇති ප්‍රධාන අවස්ථා තුන (03) පරීක්ෂා කරන්න.

(ලකුණු 40)

## 02-කොටස

09. I. සංගීත හා රිද්මයානුකූල චලනයන් තුළින් සංවර්ධනය කළ හැකි කුසලතා **හතරක් (04)** නම් කරන්න. (ලකුණු 06)

ii. සුදුසු ක්‍රියාකාරකමක් උදාහරණයක් ලෙස දක්වමින් පෙරපාසල්/ ප්‍රාථමික පන්තිකාමරයේ ක්‍රියාකාරී සහ ආකර්ශනීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සංගීතය සහ රිද්මයානුකූල චලන භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 14)

10. I. කතන්දර කීම භාවිත කිරීමෙන් අපේක්ෂා කරන ඉගෙනුම් ඵල කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

ii. ගුරුවරයෙකු ලෙස ඔබේ පෙර පාසල්/ ප්‍රාථමික පාසල් සිසුන්ගේ භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා කතන්දර කීම ඵලදායී ලෙස යොදාගත හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. i. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමේදී ගුරුවරයාගේ භූමිකාවන් **හතරක් (04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. **"පෙර පාසල් දරුවන්ගේ පෞරුෂ සංවර්ධනයට සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ප්‍රබල බලපෑමක් ඇති කරයි".** ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද, සුදුසු උදාහරණ සමඟ ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 12)

12. i. දරුවෙකුගේ පූර්ණ සංවර්ධනය සඳහා නිර්මාණාත්මක සංගීතයේ සහ නිර්මාණාත්මක චලන වල දායකත්වය ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

ii. ළමයෙකුගේ පූර්ණ සංවර්ධනය සඳහා නිර්මාණාත්මක සංගීතය සහ නිර්මාණාත්මක චලන වල දායකත්වය පිළිබඳව ඔබ ඉහත සඳහන් කළ කරුණු **දෙකක් (02)** සාකච්ඡා කරන්න. (ලකුණු 16)

13. i. මුල් ළමාවියේ සහ ප්‍රාථමික අධ්‍යාපනයේ රූකඩ පදනම් කරගත් ඉගෙනීමේ වැදගත්කම් **හතර (04)** ක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

ii. ප්‍රාථමික ශ්‍රේණියේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යටතේ තේමාවක් තොරාගන්න. සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක ක්‍රියා සංවර්ධනය කිරීම සඳහා **ක්‍රියාකාරකම් (03)** ඇතුළත් පාඩම් සැලැස්මක් සකස් කරන්න. ඔබේ පාඩම් සැලැස්මට පහත කරුණු ඇතුළත් කළ යුතුය.

(අ) ශ්‍රේණිය
(ආ) තේමාව
(ඇ) ඉගෙනුම් ඵල
(ඈ) ඉගෙනුම් ආධාරක
(ඉ) පියවර (ලකුණු 16)

*******************************************************************